PMoE Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry of Education, Information Technology & Cultural Affairs

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – ME/E/04/V

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2023.01.03

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගැටන්ගම, රත්නපුර.

**ජාතික පාසල් හෝ පළාත් පාසල් වෙත අනුයුක්ත කර ඇති ගුරුවරු නැවත සේවා ස්ථාන වෙත ස්ථානගත කිරීම.**

උක්ත මැයෙන් යුතුව මා වෙත එවා ඇති සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සීඑස් 06/01/10/02 හා 2022.12.23 දිනැති ලිපිය මගින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව, **සබරගමුව පළාත් පාසල් වෙතින් ජාතික පාසල් වෙතට ලබාදී ඇති සියලුම තාවකාලික ගුරු අනුයුක්ත ද 2023.01.05 දින සේවයෙන් පසු අවලංගු කල යුතුවේ.**

02. එබැවින් **2023.01.05 දිනෙන් පසු පළාත් පාසල් වෙතින් ජාතික පාසල් වෙතට ගුරු අනුයුක්ත කිරීම්** සිදුකිරීමට හෝ දැනට ලබාදී ඇති අනුයුක්ත දීර්ඝ කිරීමට නිර්දේශ ඉදිරිපත් නොකල යුතු බවත්, මෙයින් අවධාරණය කර සිටින අතර, දැනට අනුයුක්තව සිටින සියලුම ගුරුවරුන් නැවත ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථාන වෙත යොමුකිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. **(දැනට පළාත් පාසල් වෙතින් ජාතික පාසල් වෙතට අනුයුක්තව සිටින ගුරුභවතුන්ගේ නාමලේඛනය නොපමාව මා වෙත ඉදිරිපත් කල යුතුය).**

03. **ඒ අනුව 2023.01.05 දිනෙන් පසු සබරගමුව පළාත් පාසල් වෙතින් ජාතික පාසල් වෙතට ගුරු අනුයුක්ත කිරීම් සිදුකරනු නොලබන බව** සැලකිය යුතු අතර, මෙම කාර්යය ප්‍රමුඛතාවයේ සලකා ක්‍රියා කලයුතුය.

04. තවද, **"පවතින ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ගුරුභවතුන්ට සහන සැලසීම"** යන මැයෙන් යුතු මගේ සමාංක හා 2022.11.21 දිනැති ලිපිය මගින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව පළාත් පාසල් අතර සිදුකර ඇති තාවකාලික ගුරු අනුයුක්තද 2023.01.05 දින සේවයෙන් පසු තවදුරටත් දීර්ඝ නොකරන බවත්, ඒ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්, ගුරුභවතුන් ඇතුලු අදාල සියලු පාර්ශවයන් දැනුවත් කලයුතු බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

සුජානි ආර්. විජේතුංග
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය රත්නපුර

පිටපත් :

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැ.පි.
2. ආණ්ඩුකාර ලේකම්, සබරමුව පළාත. - කාරු. ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීමට
3. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්. - ඔබ කලාපයේ ජාතික පාසල් වෙතට අනුයුක්තව සිටින ගුරුභවතුන්ගේ නාම ලේඛනය නොපමාව මා වෙත ඉදිරිපත් කිරීමට හා ඉහත උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා.
4. සබරගමුව පළාතේ සියලුම ජාතික පාසල්වල විදුහල්පතිවරුන් - ඔබ පාසල වෙතට අනුයුක්තව සිටින සියලුම ගුරුභවතුන් ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථාන වෙතට මුදාහැරීමට අ.ක.ස.